
# වම්බටුයි, තක්කාලියි එකම ගහේ

ඔබගේ ගෙවත්තේ තක්කාලියි වම්බටුයි වෙන වෙනම වවා ගන්න ඉඩකඩ මදිනම් මෙන්න එකම ගහේ තක්කාලියි වම්බටුයි හද ගන්න ක්‍රමයක්. මුලින්ම ඔබ කළ යුත්තේ හොඳ වර්ගයේ වම්බටු ගස් කීපයක් පාත්තියක හද ගන්නා එකයි. එක්කෝ වම්බටු බීජ ලබා ගෙන තවානේ දමා පැල හද ගන්නට පුළුවන්. එහෙම නැති නම් තවානකින් පැල ලබාගෙන සිටුවාගන්නට පුළුවන්. වම්බටු පැල තරමක් දුරට හැදුනහම හොඳ වර්ගයේ තක්කාලි පැල තුන හතරක් පෙට්ටියක හෝ මුට්ටියක් වැනි භාජනයක හොඳට පෝර දමා හදා ගන්න.




I

තක්කාලි පැල තරමක් වැවුනහම වම්බටු පැලවලට තක්කාලි අතු මේ විධිහට බද්ධ කරන්න. වම්බටු අත්තක් බ්ලේඩ් තලයකින් කපන්න. මේ කැපුම අඟලක් පමණ ගැඹුරට බ්ලේඩ් තලයෙන් පලන්න. (පින්තූරය ii).




II

දැන් මේ වම්බටු අත්ත තරමම මහත තක්කාලි අත්තක් කපා ගෙන උල්වන විධිහට දෙපැත්තෙන් කපා ගන්න (පින්තූරය iii).



III

වම්බටු අත්තේ පැලුම තරමක් ඇත් කර තක්කාලි අතු කැබැල්ල පැලුමට ප්‍රවේශමෙන් ඇතුල් කරන්න. තක්කාලි අත්ත තලන්නේ නැතුව ක්‍රමයෙන් ඇතුල් කළ යුතුයි. (පින්තූරය iv).



(iv)

දැන් මේ සන්දිය පොලිතින් පටියකින් හෝ රෙදි පටියකින් හොඳින් වෙලා තබන්න. තක්කාලි අත්තෙන් වැඩි ජල ප්‍රමාණයක් පිට වී නොයෑම වළක්වන පිණිස එහි කොළ කීපයක් ඉවත් කරන්න. දල්ල පමණක් ඉතිරි කරන්න. මේ සන්දිය ඉක්මනින් පැහී අත්ත වැඩී හොඳ තක්කාලි අස්වැන්නක්ගෙන දෙනවා. වම්බටු ගසේ අනික් අතුවල වම්බටු ද හැදෙනවා. මේ ක්‍රම යෙන් අඩු ඉඩකඩ ප්‍රමාණයකින් ඔබගේ ගෙවත්තෙන් තක්කාලි සහ වම්බටු යන එළවළු දෙවර්ගයම ලබා ගන්නට පුළුවන්.